# 14 රෝගීන් ආලේපය



14.1 රූපය - රෝගීන් ආලේප කිරීම

දිව්‍ය වෛද්‍යවරයාණෝ ජේසුස් වහන්සේ බැවින් සුව කිරීමේ පමණක් නොව පව් කමා කිරීමේ බලය ද උන්වහන්සේ සතු ය. එම සුව කිරීමේ බලය අපෝස්තුලුවරුන්ට ද දානය කළ සේක: "රෝගීන් සුව කරන්න" (මතෙව් 10:8) එම බලය පසු කාලයේ දී අපෝස්තුලුවරුන් දියත් කළ ආකාර පහත පාඨය පෙන්වා දෙයි.

> ඔබ අතුරෙන් යමෙක් රෝගී ව සිටින්නේ නම්, ඔහු සභා මූලිකයන් (පූජාප්‍රසාදීන් වහන්සේලා) කැඳවාගනී වා. ඒ මූලිකයෝ ස්වාමීන් වහන්සේගේ නාමයෙන් ඔහු තෙලින් ආලේප කොට, ඔහු උදෙසා යාච්ඤා කරත්වා. එවිට ඇදහිල්ලෙන් පුදන යාච්ඤාවෙන් රෝගියාට සුවය ලැබේ. ස්වාමීන් වහන්සේ ඔහු නැගිටුවනු ඇත. ඔහු පව්කර තිබේ නම්, ඒ පව් ඔහුට කමා කරනු ලැබේ.
>
> (ජාකොබ් 5:14-15)

අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම් අනුව රෝගීන් ආලේප කරනු ලබන්නේ පූජාප්‍රසාදීන් වහන්සේලා විසිනි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

රෝගීන්ගේ ආලේපය පිළිබඳ ව මහෝපදේශයේ මෙසේ සඳහන් වේ.

කෙනෙකු බරපතළ ලෙස රෝගී ව සිටින විට ඔහුට ආධ්‍යාත්මික ශක්තියත්, කායික සුවයත් පතා දනය කරනු ලබන ප්‍රසාද නිධානය රෝගීන්ගේ ආලේපය වන්නේ ය.

මෙය අන්තිම ආලේපය යනුවෙන් ද හැඳින්වේ. වැඩිකොට ම එයට හේතු වූයේ මෙම ආලේපය කෙනෙකු තම ජීවිතයේ අවසාන කොට ලබා ගන්නා ආලේපය වන නිසා ය.

එහෙත් මරණාසන්න වූ විටෙක පමණක් මෙම ප්‍රසාද නිධානය ලැබිය යුතු යැයි පිළිගැනීම වැරදි ය. රෝගීන් සුවපත් කිරීමට ද මෙම දේව ප්‍රසාද නිධානය හේතු වේ.

(මහෝපදේශය 261)

**රෝගීන්ගේ ආලේපය නම් දේව ප්‍රසාද නිධානය ලැබිය හැකි අය;**

- ★ වයස්ගත වී හෝ රෝගී වී හෝ මරණාසන්න තත්ත්වයේ සිටින අය
- ★ බරපතල සැත්කම්වලට සූදනම් කරන අය
- ★ මරණාසන්න නොවූවත් ස්වල්ප කාලයකින් මිය යා හැකි අය

ක්‍රිස්තු භක්තිකයෙකු බරපතළ ලෙස රෝගාතුර වන සෑම අවස්ථාවක දීත් මෙම දේව ප්‍රසාද නිධානය ලබා තිබිය දී රෝගී තත්ත්වය උත්සන්න වූ විටෙකත් රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය නැවත ලබා ගත හැකි වන්නේ ය.

(කතෝලික සභා ධර්මෝපදේශය 1529)

රෝගීන්ගේ ආලේපය නැවත නැවත ලබා ගත හැකි දේව ප්‍රසාද නිධානයකි.



නොමිලේ බෙදහැරීම සඳහා ය.

## රෝගීන්ගේ ආලේපය මගින් ලැබෙන වරප්‍රසාද

රෝගීන් ආලේප කිරීමේ ප්‍රසාද නිධානයේ ප්‍රතිඵල ලෙස ලැබෙන විශේෂ වරප්‍රසාද කතෝලික සභා ධර්මෝපදේශයේ 1532හි මෙලෙස සඳහන් වේ.

- පෞද්ගලික ව තමන්ගේත් මුළු ශුද්ධ වූ සභාවේත් යහපත වෙනුවෙන් රෝගී වූ පුද්ගලයා ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තියට සම්බන්ධ කිරීම.
- රෝගී බවේ හෝ වයස්ගත වීමෙන් හෝ ඇති වන වේදනා ක්‍රිස්තියානි ලීලාවෙන් දරා ගැනීමට අවශ්‍ය ශක්තිය, සාමය හා ධෛර්ය ලැබීම.
- රෝගී තැනැත්තාට පව් කමා කිරීමේ දේව ප්‍රසාද නිධානය මගින් පාප ක්ෂමාව ලබා ගැනීමට අවස්ථාවක් නොතිබුණේ නම් ඔහුගේ පාපවලට ක්ෂමාව ලැබීම.
- ඔහුගේ / ඇයගේ ආත්ම ගැලවීමට ගෝචර වන්නේ නම් සුවය නැවත පිහිටුවීම සදාකාලික ජීවිතය කරා එතෙර වීමට සූදානම් කිරීම.

මෙම වරප්‍රසාද රෝගියාට හිමි කර දීමට රෝගීන්ගේ ආලේපය ලබා දිය යුතු ය. ඒ සඳහා අප පූජාප්‍රසාදින් වහන්සේ කැඳවා ගත යුතු වේ. පූජාප්‍රසාදින් වහන්සේ පැමිණීමට පෙර ස්ථානය සහ පුද්ගලයා සූදානම් කිරීම අප සතු යුතුකමකි.

### ස්ථානය සහ පුද්ගලයා සූදානම් කිරීමට කළ යුතු දේ

- ★ මේසයක් මත සුදු රෙද්දක් එළා එය මත කුරුස ප්‍රතිමාවක් සහ පහනක් තැබීම.
- ★ අත්පිස්නාව, වතුර බේසම, සබන් ආදිය සූදානම් ව තැබීම.
- ★ හැකි පමණින් රෝගියා සහ ස්ථානය පිරිසිදු කිරීම.

රෝගීන්ගේ ආලේපය රෝගීන් සඳහා මිස මරණාසන්න වූවන් සඳහා පමණක් නොවන බව වටහා දී රෝගියා ශාරීරික ව මෙන් ම මානසික ව ද සූදානම් කළ යුතු ය. මෙම ආලේපය පිළිබඳ ව රෝගියා තුළ චකිතයක් හටගත හැකි නිසා ඒ බිය පහ කළ යුතු ය.

රෝගීන්ගේ ආලේපය දානය කිරීමට ලෙඩෙකු අසාධ්‍ය වන තුරු බලා සිටීම යෝග්‍ය නොවේ.

වෙහෙස නොබලා රෝගීන්ට ඇප උපස්ථාන කළ යුතු වෙමු. රෝගීන් ආලේප කිරීම මගින් වරප්‍රසාද ලැබෙන බව අපි දනිමු. ඒ නිසා අපි ඔවුන් එයට යොමු කරමු. දේව දරුවන් වන අපි අන් අයට මරණ මොහොතට පෙර ඒ සබැඳියාව ඇති ව අවසන් ගමන් යාමට උදව් කරමු. රෝගීන්ගේ ආලේපය සඳහා යොමු කළ යුතු අය හඳුනා ගෙන මීසම් සේවක පූජාප්‍රසාදින් වහන්සේට ඔවුන් පිළිබඳ ව දැනුවත් කරමු.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

### ක්‍රියාකාරකම

1. රෝගීන්ගේ ආලේපය මගින් ලැබෙන වරප්‍රසාද **තුනක්** නම් කරන්න.
2. රෝගීන් වෙනුවෙන් ඔබේ යුතුකමක් ලියන්න.
3. රෝගී පුද්ගලයන් බලන්නට ගොස් කිව හැකි යාච්ඤාවක් ලියන්න.

**ජීවිතයට බිඳක්**

*රෝගීන් වෙනුවෙන් දිනපතා යාච්ඤා කරමු.*



නොමිලේ බෙදාහැරීම සඳහා ය.